කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

නීති පීඨය

නීතිවේදී ගෞරව උපාධි පරීක්ෂණය - පළමු වසර

දෙවන සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2023

**LAW 12404 - ගිවිසුම් නීතිය**

(පැය 2 මිනිත්තු 15)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **04**

ඕනෑම ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

(අපහැදිළි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

**1.** (අ), (ආ) සහ (ඇ) යන කොටස් සියල්ලටම පිළිතුරු සපයන්න.

නිලු, 2023 දෙසැම්බර් 05 වන දින, රු.100,000ක මුදලකට පෞරාණික පෙට්ටගමක් විකුණන බව සඳහන් කරමින් පුවත්පතක දැන්වීමක් පලකළාය . මලී, දැන්වීමේ සඳහන් දුරකථන අංකයට එදිනම කතා කර පෞරාණික පෙට්ටගම මුදලින් රු.80,000ක් ගෙවා සහ රු.20,000ක් වටිනා මල් බඳුනක් ලබා දී මිලදී ගැනීමට කැමති බව දක්වමින් ප්‍රතිචාර දැක්වූවාය. ඇමතුමට පිළිතුරු දුන් නිලූගේ ලේකම් අමිල, මලී ප්‍රකාශ කල දෙයට එකඟ විය. අමිල, ගිවිසුම් කෙටුම්පත මලී වෙත විද්‍යුත් තැපෑලෙන් යවා, ඇයගේ දත්ත ඇතුලත් කොට ලේඛනය මත ඇයගේ විද්‍යුත් අත්සන තබා එය නැවත විද්‍යුත් තැපෑලෙන් ආපසු එවන ලෙස දන්වා සිටියේය. මලී, තම විද්‍යුත් තැපැල් ගිණුමේ ඇති වූ ගැටලුවක් හේතුවෙන්, ගිවිසුම මුද්‍රණය කර **(Printed)** ඒ මත අත්සන් කර තම දුරකතනයෙන් එය ස්කෑන් **(Scan)** කර අමිල වෙත දෙසැම්බර් 07 වන දින වට්ස්සප් **(Whatsapp)** මාර්ගයෙන් යැවීය. එය නිවැරදි ආකාරයට යැවුණු බවට දැනුම් දීමක් **(Notification)** ඇය වෙත ලැබුණි. කෙසේවෙතත්, අමිල, එම පණිවිඩ කියවීමට පෙර ඔහුගේ දුරකතනය අස්ථාන ගත වූ අතර එය නැවත ඔහු වෙත ලැබුණේ දෙසැම්බර් 10 වන දා ය. මේ අතරතුර , ප්‍රවීනා, දෙසැම්බර් 08 වන දින, පුවත්පත් දැන්වීම දැක නිලු අමතමින් එම පෞරාණික පෙට්ටගම රු. 100,000 ක මුදලකට තමන් මිලදී ගැනීමට කැමති බව දන්වා සිටියා ය. මෙම මොහොත වන විට නිලු හට මලී ගෙන් කිසිදු තොරතුරක් නොලැබුණු බැවින් පෞරාණික පෙට්ටගම ප්‍රවීනා වෙත විකිණීමට නිලු එකඟ විය. ප්‍රවීනා, නිලුගේ මිතුරියක වූ බැවින් එම මුදල් දෙසැම්බර් 09 වන දින නිලූගේ නිවසේ තැබිය.

**(අ).** මෙහි පෞරාණික පෙට්ටගම විකිණීම උදෙසා වලංගු ගිවිසුමක් තිබේද ?, තිබේ නම් ඒ කා සමගද යන්න අර්පණය **(Offer)** හා ප්‍රතිග්‍රහණය **(Acceptance)** යන අංග කෙරෙහි අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න.

(ලකුණු: 10)

(ආ). මලී, රු. 20,000ක වටිනාකම වෙනුවෙන්, නිලු වෙත ලබා දීමට අදහස් කරන මල් බඳුන, පිපිරී ඇති බවත් එහි කිසිදු වටිනා කමක් නැති බවත් නිලු හට දැනගන්නට ලැබුණි. එය තවදුරටත් අගනා ප්‍රතිෂ්ඨාවෙහි **(Valuable Consideration)** කොටසක් ලෙස සැලකිය හැකිද යන්න පිලිබඳව විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු: 10)

(ඇ). විද්‍යුත් වාණිජ්‍යයෙහි **(E-commerce)**, තැපැල් රීතිය තුළ ප්‍රතිග්‍රහණය සන්නිවේදනය කිරීමේ අදාළත්වය හෝ එහි නොහැකියාව පිළිබඳව ඉහත සිද්ධිමය කරුණු ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු: 10)

(මුළු ලකුණු: 30)

2. රමණී, WJ Tailors සමග ප්‍රාසංගික ඇඳුම් පැළඳුම් 25ක ප්‍රමාණයක් මැසීම සඳහා ගිවිසුමකට එළඹුණාය. රමණී, රු. 75,000ක අත්තිකාරම් මුදලක් ගිවිසුමට එළඹෙන අවස්ථාවේදි ගෙවූ අතර ඉතිරි රු. 250,000ක මුදල ඇඳුම් භාර දෙන අවස්ථාවේදි ගෙවීමට එකඟ විය. 2023 දෙසැම්බර් 20 වන දින, එම දිනය අවසන් වීමට පෙර රමණීගේ නිවසේදී අදාළ ඇඳුම් පැලඳුම් තොගය භාර දීමට සැලසුම් කර තිබුණි. රමණී, මැහුම් සඳහා රෙදි ලබා දුන් අතර, 2023 නොවැම්බර් 15 හෝ ඊට පෙර, ප්‍රසංගයට සහභාගිවන්නන්ගේ මිනුම් ලබා ගැනිම සඳහා WJ Tailors වෙත ඇරයුම් කළාය. 2023 දෙසැම්බර් 20 වන දින වන විට මැහුම් අවසන් කිරිමට WJ Tailors අපොහොසත් වූ අතර භාර දීම සිදු කළේ 2023 දෙසැම්බර් 22 වන දින රාත්‍රී 9ට පමණය. WJ Tailors, රමණී, ලබා දුන් රෙදි වර්ගය නොව වෙනස් රෙදි වර්ගයක් ඇඳුම් මැසීම සඳහා මිශ්‍රකර ඇති බවත්, ඉන් ඇඳුම් 6ක් ප්‍රසංගයට සහභාගීවන්නන් හට යෝග්‍ය නොවන බවත් පසුදා ප්‍රසංගය අතරතුර රමණී හට පෙනී ගියා ය. නියමිත වේලාවට ඇඳුම් භාර දුන්නේ නම් සහභාගීවන්නන්ට ඒවා ඇඳ බැලීමේ අවස්ථාවක් තිබූ බව රමණීගේ අදහස විය. රමණී, තම අප්‍රසාදය දක්වමින් ඉතිරි මුදල් WJ Tailors වෙත ගෙවීම ප්‍රතික්ෂේප කල අවස්ථාවේ, රමණී ලබා දුන් වෙනස් ස්වභාවයක රෙදි හේතුවෙන් ඇඳුම් මැසීම සඳහා අමතර ශ්‍රම පැය අවශ්‍ය වූ හෙයින් එම ප්‍රමාදය සිදු බව WJ Tailors දක්වා සිටියේය.
රමණී ඔබෙන් නීති උපදෙස් පතයි. ගිවිසුම් නියම **(Terms of a Contract)** සම්බන්ධ නීතිය කෙරෙහි අවධානය යොමුකරමින් ඇයට උපදෙස් දෙන්න.

(මුළු ලකුණු: 30)

3. අපේක්ෂාභංගත්ව මූලධර්මය (Doctrine of Frustration) අර්ථ නිරූපණය කිරීම සඳහා බහු සාධක ප්‍රවේශය (Multi-Factorial Approch) අදාළ කරගැනීමෙන් එහි විෂයපථය පුළුල් කොට සමකාලීන පරිස්ථිතීන්හි (Contemporary Environmnet) සංකීර්ණ තත්වයන් ආවරණය කොට ඇත.

නෛතික අධිකාරීන් ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

(මුළු ලකුණු: 30)

4. (අ), (ආ) සහ (ඇ) යන කොටස් සියල්ලටම පිළිතුරු සපයන්න.

(අ.) ගිවිසුමක් බලරහිත කල හැකි සාධකයක් (Vitiating Factor) ලෙස බලහත්කාරයෙහි (Duress) විෂයපථය එහි පටු ආරම්භය හා සසඳනවිට පුළුල් කර ඇති අතර එමගින් ගිවිසුමක් බල රහිත කල හැකි සාධකයක් ලෙස අයුතු බලපෑමේ (Undue Influence) අදාළත්වය අනවශ්‍ය වී ඇත. ගිවිසුමක් බලරහිත කල හැකි සාධක වන බලහත්කාරය හා අයුතු බලපෑම සන්සන්දනය කරමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් තහවුරු කරන්න.

(ලකුණු: 10)

(ආ.) ගිවිසුමක් බලරහිත කල හැකි සාධකයක් ලෙස (Vitiating Factor) වැරදීම (Mistake) යටතේ ගිවිසුමක් බිහිකිරීම වළකන දෝෂ සහ ගිවිසුමක් බල රහිත කරන දෝෂ පිළිබඳව සන්සන්දනය කරමින් පැහැදිලි කරන්න. ඔබේ පිළිතුර විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් තහවුරු කරන්න.

(ලකුණු: 10)

(ඇ.) ගිවිසුමක් බල රහිත කිරීම උදෙසා වරදවා දැක්වීම (Misrepresentation) සාර්ථකව තහවුරු කිරීම සඳහා අදාළ වන කරුණු සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් තහවුරු කරන්න.

(ලකුණු: 10)

(මුළු ලකුණු: 30)

**********************************